ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2569 2025 ජූලි 10 ඇසල කළාපය

දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති
ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,
කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,
ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

"කල්‍යාණ මිත්‍රයා"

"තුය්හං ඛෝ පන මහාරාජ' නාමේ කස්සපෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ අධිවාසේති බාරාණාසියං වස්සාවාසන්ති ආත්ථි අඤ්ඤථත්තං, අත්ථි දෝමනස්සං, තයිදං සටිකාරේ කුම්භකාරේ නත්ථි ච නව භවිස්සති'

(මජ්ඣිම නිකාය, මජ්ඣිම පණ්ණාසකය, සටිකාර සූත්‍රය)

සුපින්වතුනි,

ඇසළ පොහොය ශාසන ඉතිහාසයේ වැදගත් සිදුවීම් රාශියක් සිදුවුණු දවසක්. බෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම, රාහුල කුමරු ඉපදීම, මහාභිනිෂ්ක්‍රමණය, මංගල ධර්ම දේශනාව පැවැත්වීම, මාතෘ දිව්‍ය රාජයාට දහම් දෙසීම, අරිට්ඨ කුමරු ඇතුළු පිරිස මහණ උපසම්පදාව ලැබීම, දළදා වහන්සේ මෙරටට වැඩම කරවීම, දළදා පෙරහැර පැවැත්වීම, වැලිවිට හිමියන්ගේ මග පෙන්වීම යටතේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු සියමෙන් භික්ෂූන් වඩම්වා උපසම්පදාව නැවත පිහිටුවීම, භික්ෂූන් පෙරවස් සමාදන් වීම, ඇසළ පොහොය දවසේ වුණු වැදගත් සිදුවීම්.

මෙම සූත්‍රයේ සඳහන් වෙන්නේ කාශ්‍යප බුදුහාමුදුරුවන්ට වස් ආරාධනා කළ

සටිකාර උපාසක තුමාගේ ගුණයහපත් කම පිළිබඳවයි.

අපේ ගෞතම බුදුහාමුදුරුවෝ විශාල භික්ෂු පිරිසක් සමග කොසොල් රටේ චාරිකා කරද්දී එක්තරා තැනක නැවතිලා. මඳ සිනා පහළ කළා. ආනන්ද හාමුදුරුවෝ ඊට හේතු විමසා ලා. එවිට බුදුහාමුදුරුවෝ අතීත සිදුවීමක් ප්‍රකාශ කළා.

"ආනන්ද, කාශ්‍යප බුදුහාමුදුරුවන්ගේ කාලෙ මේ ප්‍රදේශයේ තිබුණේ වෙහළිංග කියල නැමති ගමක්. එහි වසු සටිකාර නම් කුඹලාට ජෝතිපාල නම් බ්‍රාහ්මණ වංශික යහළුවකු සිටියා. දිනක් සටිකාර යහළුවා අමතා බුදුන් දැකීමට යන්න කථා කළා. ඒ මුඩු මහණ දැකීමෙන් පලක් නැතැ' යි ජෝතිපාල කිව්වා. තෙවතාවක්ම කථා කළත් ජෝතිපාල දුන්නේ ඔය පිළිතුරමයි. එහෙනම් අපි නාන්න යමු'යි කීවාම ජෝතිපාලත් ඊට කැමති වුණා. නාන තොටේදීත් "බුදුන් දකින්න යමු'යි කීවාත් ජෝතිපාල අකැමති වුණා. ඊට පස්සේ ජෝතිපාල නාන්න ඇඳපු රෙද්ද ඉණ ගාවින් අල්ලාගෙන කථා කළා, එත් ආවේ නැහැ. නාලා ඉවර උනාට පස්සේ ජෝතිපාලගේ කෙස් වැටියෙන් අල්ලාගෙන කථා කළා. මොහු මගේ යහළුවා වුණත් මට වඩා කුලයෙන් පහළ කෙනෙක්,ඒ උනත් මගේ කෙස් වැටියෙන් අල්ලාගෙන කථා කරන්නේ හොඳ දෙයකට වෙන්නැති' කියලා හිතපු ජෝතිපාල යහළු සටිකාරගෙන් මෙහෙම ඇහුවා. " ඔබ මට මෙච්චර දේවල් කළේ මාව බුදුන් දකින්න එක්කගෙන යන්නද?"
" ඔව්, ඒක ඉතා උසස් ගමනක් මං ඔබව වාරක දෙකට කථා කරන්නේ නැහැ."
" එහෙනම්, මගේ කෙස් වැටිය අත්හරින්න. අපි එහාට යමු.

දෙදෙනාම පන්සලට ගියා. සටිකාර බුදුහාමුදුරුවන්ට වැඳලා එකත් පසෙක හිටියා. ජෝතිපාල පිළිසඳර කථා කරලා එකත් පසෙක හිටියා. "ස්වාමිනි මේ ඉන්නේ මගේ හොඳම යහළුවා වන ජෝතිපාල . මොහුට ධර්ම දේශනා කරන සේක්වා! සටිකාර ඉල්ලා සිටියා. බුදුහාමුදුරුවෝ දෙදෙනාටම බණ කිව්වා. ආපහු ගෙදර යද්දී ජෝතිපාල තම යහළුවාගෙන් අහනවා ඔබ හැමදාම බණ අහනවනේ කවදාවත් මහණ වෙන්න හිතුණේ නැද්ද?.

යහළුව මගේ මව්පියන් මහලුයි අන්ධයි. ඔවුන්ට උවැටන් කරන්නේ මම, මං මහණ වුණොත් ඒ දෙන්න අසරණ වෙනවා. ඔබ මහණ වෙන්න සටිකාර කිව්වා, දෙදෙනාම ගෙදර නොගොහින් නැවත පන්සලට ගියා. "ස්වාමිනි, මගේ යහළුවා මහණ වෙන්න කැමතියි.මොහු මහණ කරවන සේක්වා!" ජෝතිපාල පැවිදි කර සති දෙකකට විතර පස්සේ බුදුහාමුදුරුවෝ බරණැස් නුවර වැඩ ඉසිපතනයේ නැවතුනා. කසී රට බරණැස් නුවර 'නිකී' නම් රජතුමාට ඒ ගැන ආරංචි වෙලා බුදුහාමුදුරුවන් හමුවන්න ආවා. බුදුහාමුදුරුවන්ගෙන් බණ ඇසූ රජතුමා හෙට දින දානය පිණිස තමාගේ මාලිගයට වඩින ලෙස ආරාධනා කළා. පසු දින දන් පිරිනමා අවසානයේ බරණැස් නුවර වස් වසන ලෙස බුදුහාමුදුරුවන්ට ආරාධනා කළා.

"මහරජ, මම වෙනත් කෙනෙකුගේ වස් ආරාධනාවක් භාරගෙන තියෙන නිසා ඔබේ ආරාධනාව භාරගන්න බැහැ'යි කාශ්‍යප බුදුහාමුදුරුවෝ ප්‍රකාශ කළා. රජතුමා තුන් වරක්ම ඉල්ලා සිටියත් බුදුහාමුදුරුවෝ භාර ගත්තේ නැහැ. තුන් මාසයක් දන් දීමට අවස්ථාව නොලැබීම නිසා රජුට දොම්නසක් ඇතිවුණා. රජු සෝවාන්වූ අයකු නිසා බුදුහාමුදුරුවන් ගැන දොම්නසක් හටගන්නේ නැහැ. "ස්වාමීනි, මට හොඳට ඔබ වහන්සේට උපස්ථාන කරන වෙනත් කෙනෙකු ඉන්නවාදැයි ? රජු ඇසුවා.

"මහරජ, කොසොල් රටේ වේහලිංග ගමේ සටීකාර නම් වළං සාදන්නෙක් ඉන්නවා. ඔහු මගේ ප්‍රධාන ගිහි උපස්ථායකයා. ඔහුගේ වස් ආරාධනාව මම භාර ගත්තා. ඔබේ ආරාධනාව ප්‍රතික්ෂේප කළාම ඔබට දොම්නසක් ඇතිවුනා. එහෙත් සටීකාරට මෙහෙම දෙයක් වුනානම් ඔහු දොම්නස් වෙන්නේ නැහැ.

"මහරජ, ඒ සටීකාර තෙරුවන් කෙරෙහි නොවෙනස් වන ශ්‍රද්ධාවකින් යුක්තයි. බුද්ධාදී ආර්යයන් කැමති වන ආකාරයට පන්සිල් කඩ නොකර ආරක්ෂා කරනවා. චතුරාර්ය සත්‍යය අනාගාමී මාර්ගඥානයෙන් අවබෝධ කරගත් කෙනෙක්, දවසට එක් වේලයි ආහාර ගන්නේ. මුදල් පරිහරණයක් නැහැ. ගං ඉවුරේ සතුන් විසින් හාරා ගොඩගසන ලද පස් ගෙනල්ලා වළං හදන්නේ. ආහාර සඳහා වළං හුවමාරු කරනවා. අන්ධ දෙමව්පියන් පෝෂණය කරනවා.

"මහරජ, එක දවසක් මං සටීකාරගේ ගෙදරට පිඬු සිඟා ගිය විට ඔහු ගෙදර හිටියේ නැහැ. සටීකාර කොහිදැයි දෙමව්පියන් ගෙන් ඇසූ විට සටීකාර බැහැරක ගිය බවත්, කුස්සියේ ඇති ආහාර බඳුන් වලින් බෙදාගෙන වළඳන්න ලෙසත් ඔවුන් මට කිව්වා. මං හට්ටි වලින් ආහාර බෙදාගෙන වළඳා පන්සලට ආවා. ගෙදර පැමිණි සටීකාර වළංවල ආහාර අඩු බව දැකල දෙමව්පියන්ගෙන් ඒ ගැන ඇසුවාම ඔවුන් හා පැමිණ දන් වළඳා ගිය බව කීවා.

"බුදුහාමුදුරුවෝ මා ගැන කොයිතරම් විශ්වාසයක් ඇතුව ද මෙහෙම කළේ. එම විශ්වාසය මා ලැබූ ලොකුම ලාභයක් කියා සිතමින් සටීකාර සතුටු වුණා. ඒ සතුට සති දෙකක් යන තුරු ඔහුටත්, දින හතක් යන තුරු දෙමව්පියන්ටත් තිබුනා."

එක්තරා වැසි කාලයක මගේ කුටිය තෙමෙන්න පටන් ගත්තා. සටීකාරගේ ගෙදරින් අලුත් තණ මිටි ගෙනෙන ලෙස මා භික්ෂූන්ට කීවා , භික්ෂූන් ආපසු පැමිණ ස්වාමිනි, සටීකාරගේ ගෙදර සෙවිල්ලන තණකොළ නැහැ. ඔහුගේ ශිල්ප ශාලාවේ වහලේ අලුතින් තණකොළ සෙවිලි කර තියෙනවා කිව්වා. ඒ ශාලාවේ සෙවිලි කරපු තණ රැගෙන එන ලෙස මා භික්ෂූන්ට කීවා. භික්ෂූන් එහි ගොස් තණ ඉවත් කරන විට ඔය ශිල්ප ශාලාවේ සෙවිල්ලපු තණ ඉවත් කරන්නේ කවුදැයි දෙමාපියන් ඇසුවා. බුදුහාමුදුරුවන්ගේ කුටිය සෙවිලි කිරීමට තණ ඉවත් කරන බව භික්ෂූන් කීවිට "ස්වාමින් වහන්සේලා ඇති තරමක් ගලවාගෙන යන්නැයි. දෙමව්පියන් කීවා. සටීකාර ගෙදර ට ආවිට ශිල්ප ශාලාවේ තණ ඉවත් කර ඇති බව දැක එය කළේ කවුදැයි ඇසුවා. බුදුකුටිය තෙමෙන නිසා එය සෙවිලි කිරීමට භික්ෂූන් ඒවා රැගෙන ගිය බව දෙමව්පියන් කීවිට ' මට මහත් ලාභයක් ලැබුණේ. බුදුහාමුදුරුවෝ

හෙතෙම විශ්වාසවන්ත වෙන්නේ මා කෙරෙහි විතරමයි. කියල සටීකාරට පුදුම සතුටක් දැනුණා. ඒ සතුටත් පෙරදී වගේම පැවතුනා. ඒ තුන් මසම ශිල්ප ශාලාව වැසිලා තිබුනේ වලාකුළුවලින් විතරයි. පොඩ්ඩක් වත් තෙමුණේ නැහැ. මහරජ, සටීකාර මේ වගේ ගුණ තියෙන කෙනෙක්.'' ''ස්වාමිනි, ඔබ වහන්සේ සටීකාර කුඹලා ගැන තබා ඇති විශ්වාසය ඔහුට මහත් ලාභයක්'' යයි රජු කීවා. ඉන්පසු කිකී රජු හාල්, එළවළු ගැල්වල පටවා වස් තුන් මාසය තුළ බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට දන් දීම සඳහා සටීකාර වෙත යැව්වා. '' මේ ධාන්‍ය සහ එළවළු වලින් මට වඩා ප්‍රයෝජන තිබෙන්නේ රජතුමාටයි. ඒ නිසා ඒවා රජුටම ආපසු ගෙන ගොස් දෙන්නැයි සටීකාර රාජපුරුෂයන්ට කීවා.

''ආනන්ද, ඒ කාලෙ ජෝතිපාල නමින් හිටියෙ වෙන කෙනෙක්ය කියල ඔබට හිතෙන්න පුළුවන්. එහෙම හිතන්න එපා. එදා ජෝතිපාල වෙලා හිටියෙ මම මයි'' කියල අපේ ගෞතම බුදුහාමුදුරුවෝ වදාළා.

කල්‍යාණ මිත්‍ර අම්මා කෙනෙක්, කල්‍යාණ මිත්‍ර තාත්තා කෙනෙක්, කල්‍යාණ මිත්‍ර දරුවන්, කල්‍යාණ මිත්‍ර සැමියන්, භාර්යාවන්, කල්‍යාණ මිත්‍ර සහෝදර, සහෝදරියන්, කල්‍යාණ මිත්‍ර ගුරුවරුන් හැමෝටම හමුවෙන්නේ නැහැ. එහෙම නැති නිසානේ අපිකල්‍යාණ මිත්‍රයන් ලැබේවා! කියල ප්‍රාර්ථනා කරන්නේ. ලෝකේ ඉන්න හොඳම කල්‍යාණ මිත්‍රයා තමයි බුදුහාමුදුරුවෝ. උන්වහන්සේ අද නැතත්, අප හැම දෙනාටම හොඳ මඟ පෙන්වා දීපු උන්වහන්සේගේ ධර්මය අපට තවම තියෙනවා.

අනුන්ගෙන් කල්‍යාණ මිත්‍රකම බලාපොරොත්තු වෙන්න කලින් අපි අනිත් අයට කල්‍යාණ මිත්‍රයෙක් විය යුතුයි. ඒ නිසා අද මේ බණ අහල මම කල්‍යාණ මිත්‍රයෙක් වෙනවා කියල හැම දෙනාම හිතට ගන්න ඕන. මේ පින් බලයෙන් කල්‍යාණ මිත්‍රයකුගෙන් බණ අහන්න ලැබී නිවන් දකින්න මේ හැම දෙනාටම හේතු වාසනා වේවා!

සැමට තෙරුවන් සරණයි!